# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නැවත නැවතත් භාවිතා කිරීම පිළිබඳ වන කනස්සල්ල

2025 අප්‍රේල් 3

ශ්‍රී ලංකා රජය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත නැවත නැවතත් භාවිතා කිරීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය දැඩි කනස්සල්ල පළ කර සිටී.

මාධ්‍ය වාර්තාවලට අනුව, ගාසා තීරයේ ඊශ්‍රායල ක්‍රියාමාර්ග විවේචනය කරන ස්ටිකර ඇලවීමට කටයුතු කළ තරුණයෙකු මෑතකදී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන තිබේ. පසුගිය මාස පහ තුළ ත්‍රස්තවාදයට සම්බන්ධතාවක් නොමැති බවට පෙනී යන හැසිරීම් ඇතුළු අවස්ථාවන් කිහිපයකදී රජය විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කර තිබීම ද කනස්සල්ලට කරුණකි. තවද, මතයක් ප්‍රකාශ කිරීමේ පදනම මත පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම බිය උපදවන්නක් වන අතර භාෂණයේ නිදහස සහ විසම්මුතියේ අයිතියට එරෙහිව පුළුල් ඇඟවුම් ඉස්මතු කරන්නකි.

මෙය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු සිය පීඩාකාරී අණ පනත් අහෝසි කිරීමට සහ රටේ සෑම ප්‍රදේශයකම ජනතාවගේ සිවිල් අයිතිවාසිකම් සහතික කරන බවට ජනාධිපති දිසානායක මහතා ප්‍රමුඛ රජය සිය මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් පොරොන්දු වී ඇති පසුබිමට එරෙහිව යන්නකි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හේතුවෙන් මෙතෙක් සිදුව ඇති අපයෝජනයන් පිළිගනිමින් ජනාධිපතිවරයා ඇතුළු රජයේ අනෙකුත් සාමාජිකයින් අතීතයේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙස ඉල්ලා සිටි බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සටහන් කරයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන බවට නැවත නැවතත් ප්‍රතිඥා දෙනු ලැබුවද, රජය තමන්ගේම ප්‍රකාශයන් ආපස්සට හරවමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දිගින් දිගටම භාවිතා කිරීම කණගාටුවට කරුණකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු තවත් බොහෝ පාර්ශවයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කරන ලෙස දශක ගණනාවක් මුළුල්ලේ අඛණ්ඩ ඉල්ලීම් සිදු කොට තිබේ. මුලින් තාවකාලික විධිවිධානයක් ලෙස හඳුන්වා දී පසුව ස්ථිර නීතියක් ලෙසට දීර්ඝ කරන ලද මෙම පනත, පරම්පරා ගණනාවක ශ්‍රී ලාංකිකයන් භීතියට පත් කිරීමට උපයෝගී කොට ගෙන ඇති අතර, එමඟින් බොහෝ දුරට ජනවාර්ගික හා ආගමික සුළුතරයන්, ක්‍රියාකාරීන්, විරුද්ධවාදීන් සහ මාධ්‍යවේදීන් ඉලක්ක කර ගනිමින් වධහිංසා පැමිණවීම සාමාන්‍යකරණය කෙරෙන දණ්ඩ මුක්තියේ සංස්කෘතියක් ශක්තිමත් ලෙස ස්ථාපිත කොට තිබේ. එවැනි භාවිතයන් ශ්‍රී ලංකාවේ අතීතයට එක් විය යුතු අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම වහාම අත්හිටුවීමටත්, හැකි ඉක්මනින් එය අවලංගු කිරීමටත්, රජය විසින් පැහැදිලි ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org